(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 17.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2019 ජනවාරි 11 වැනි සිකුරාදා අ.භා. 1.30 ට**

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, නියෝජ්‍ය කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් දහහතර දෙනෙකුගෙන් (14) සමන්විත විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115හි විධිවිධානවල සහ 2019 ජනවාරි 08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගත් යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2019 ජනවාරි 10 වැනි දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් දහහත් දෙනෙකුගෙන් (17) සමන්විත විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 122හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දහනව දෙනෙකුගෙන් (19) සමන්විත විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 126(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන ආණ්ඩු පාර්ශ්වයේ පසුපෙළ මන්ත්‍රීවරයන් අට දෙනෙකුගෙන් (08) සහ විරුද්ධ පාර්ශ්වයේ පසුපෙළ මන්ත්‍රීවරයන් අට දෙනෙකුගෙන් (08) සමන්විත විය යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා,— උදර්පන පනත යටතේ නියමය,— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ තුර්කි ජනරජය අතර උදර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2018 ජූලි 13 දිනැති අංක 2079/77 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***